එස්.ඩබ්ලිව් මහත්තයා, අපි හොස්පිටල් එකේ පාර හදලා දුන්නනේ. අපි තමයි එදා ඉදලා ඒවා නඩත්තු කරන්නේ. තැපැල් කායර්ාලයේ ඒ තාර ගැලවිලා තියෙන්නේ. ඒක පොඩ්ඩක් බලලා කරලා දෙන්න.ඇස්තමේන්තුවක් අරගන්න.

**ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා**

පක්ෂ විපක්ෂ භේදයක් නැතිව සියළු දෙනාම එකතු විය යුතු කාලය එළඹිලා තියෙන්නෙ.රඹුක්කන සිද්ධිය ගැන අපි කණගාටු වෙනවා .ඒ තරුණයා මරලා ඉවර වෙලා ඒක හරි කිව්වා.පොලිසිය භාර ඇමති වරයා කියනවා එයා මැරුනේ නැත්නම් තුන්දහස් ගානක් මැරෙන්න තිබුණා කියලා.ඒක ඇත්තටම බොරු .බව්සරය තිබුනේ කෙහේවත් .වෙඩි තිබ්බේ තව කොහේවත්.ඇත්තටම කියනවා නම් මිලිටරි පාලනයක්.බලය රැක ගන්න ලංකාවේ ඉන්න ඔක්කොම මිනිස්සු මැරිලා ගියත් කමක් නැහැ.ඒ ගොල්ලන්ට ඕන බලය.

කාලයක් ගිහිල්ලා හරි අද පාලරීමේන්තුවට 21 වෙනි සංශෝදනය ගෙනල්ලා තියෙන්නේ.20 වෙනි සංශෝදනය කැන්සල් කරලා නැවත් 19 වෙන සංශෝදයනය බල ගන්වන්න ඕන නිසා තමයි ගෙනල්ලා තියෙන්නේ.19 කියලා ගේන්න බැහැ.ව්‍යවස්ථාවේ හැටියට ගෙන්න බැහැ. ඒක තමයි 21 කියලා දාලා ගේන්නේ. ඒක තමයි ව්‍යවස්ථාවේ හැටියට තියෙන්නේ. දැන් අද ගෙනල්ලා තියෙනවා 21. ඒක දෙයියනේ කියලා පාස් වුනොත් ගොඨාභය මහත්තයා ගෙදර යනවා.බැසිල් මහත්තයාත් ගෙදර යනවා. එයා ඇවිත් තමයි රට විනාස කලේ.

අනිත් එක දැන් තෙල් ගැන කතා කරා. බොරතෙල් ගෙනල්ලා තිබ්බානම්. බොරතෙල් ගේන්න ඩොලර් නැහැ කිව්වා. බොරතෙල් නැතුව මේගොල්ලෝ ඩීසල් ගෙනාවා.ඒකට කොහෙන්ද මුදල් තිබුනේ. ඒක ගේන්නේ නැතැව මේගොල්ලෝ බොරතෙල් ගෙනල්ලා තිබ්බා නම් ලාම්පුතෙල් හිටන් ගන්න තිබ්බා. එතනින් අපිට වාසියක් තියෙනවා. ඒ වාසිය නෙමෙයි මේගොල්ලෝ බැලුවේ ඒගොල්ලන්ගේ කොමිස් ගැන විතරයි. එතන ඒ කොමිස් හින්දා තමයි මේගොල්ලෝ පෙට්‍රලුයි, ඩීසලුයි ගෙනාවේ.

තව එකක් තමයි තෙල් පිරිපහදු කරන මිනිස්සුන්ට නිකන් පඩි ගෙවාගෙන ඉන්නවා. ඒක පාඩු නෙමෙයිද. සැලසුම් බංකොලොත් කරලා දැම්මා. අනිත් එක බැංකුවේ තියෙන ඩෙලර් එක පහළ තියාගෙන ඒගොල්ලෝ බ්ලැක් මාකර්ට් එකෙන් ඩොලර් ගෙන්නුවා.ඒනයි රට විනාශ උනේ.

අනිත් එක දැන් කියනවා මේ පොහොරවලින් බැහැ කියලා දැන්ද කියන්නේ.එක්කෙනෙක් මැරෙනකන් හිටියා. නිකන් සල්ලි ගෙව්වා. ඒ කාගේ සල්ලිද ජනතාවගේ සල්ලි.ඒ ජනතාවගේ සල්ලි.

මම සන්තෝස වෙනවා පෙරේදා උද්ඝෝෂණයක් කරා වරායේ කට්ටියගේ ඒකට අපේ සජිත් මන්ත්‍රීතුමා පක්ෂ භේදයකින් තොරව එදා උද්ඝෝෂණයේ හිටියා හරිම සන්තෝසයි ඒක ගැන. දැන්වත් තේරිලා ඉදිරියට ඇවිල්ලා තියෙන හින්දා. මිනිස්සුන්ට ප්‍රශ්නයක් තියෙනකොට අපි පාරට බහිනවා පක්ෂභේද ඕනේ නැහැ. ඒක හින්දා සභාපතිතුමා මෙතනින් මගේ ශෝකය එල කරනවා රට වෙනුවෙන් ජීවිතය පුදපු ළමයි දෙන්නගේ තාත්තා ගැන. නම තමයි චමින්ද ලක්ෂාන්. එයා වෙනුවෙන් මගේ ශෝකය එල කරනවා. විනාඩියක් ශෝකය එල කරන්න පුලුවන්නම් ලොකු දෙයක් සභාපතිතුමා.

**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**

එයාගේ පවුලේ උදව්යට අපි සභාවෙන් ශෝකය එල කරලා යවමු.

**ගරු මන්ත්‍රී - එම්.එෆ්.එම්.හසන් මහතා**

සභාවෙන් අවසරයි.අපි මේ වෙලාවේ අපේ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා රඹුක්කන සිද්ධියෙන් මරණයට පුද්ගලයා වෙනුවෙන්. මේක රජයේ ත්‍රස්තවාදි ප්‍රහාරයක්. කන්න නැතුව, පිටි, ගෑස්, ඩීසල් මුකුත් නැතුව අත්‍යවශ්‍ය භාණ්ඩ නැතිව පීඩා විදින වෙලාවේ අර චමින්ද ලක්ෂාන් ළමයි දෙන්නගේ තාත්තාව මරලා දාපු එක. ඒ විතරක් නෙමෙයි තව තුන් දෙනෙකුට බරපතල තුවාලයි. තව තුන්දෙනෙකුට අමාරුයි අයි.සී.යූ එකේ ඉන්නේ. මෙහෙම කරපු මේ රටේ රජයට විරුද්ධව මේ රටේ සමස්ථ ජනතාවම විරුද්ධත්වයෙන් මේ ඉන්නේ. ජනතාවට සහන දෙන රජයක් නෙමෙයි මේක. ජනතාව මරන රජයක් මේක. එක පැත්තකින් කන්න නැතුව මරනවා. අනිත් පැත්තෙන් වෙඩි තියලා මරනවා.මෙහෙම ගියොත් මේ රටේ කිසිම මන්ත්‍රිවරයෙකුට ඇමතිවරයෙකුට ඉන්න බැරි වෙයි. ජනතාවට ප්‍රශ්න තියෙනවා. හැම රටේම ප්‍රශ්න තියෙනවා. බඩගින්නේ ඉන්නවා කියලා කියන්නේ කරන්න වැඩක් නැහැ ඒගොල්ලොන්ට. නීති විරෝධී වැඩ හැමදාම කරන්න ඉස්සරහට එනවා.

යාපනයේ මරාගෙන මැරෙන කොටි ත්‍රස්තවාදය පටන් ගත්තේ බඩගින්නේ. අපේ ඉන්න සිංහල ජනතාව ඒකට ඉස්සරහට එන්න ඉඩතියන්න එපා කියලා අපි රජයට බල කරනවා. සභාපතිතුමා ජනතාව ඇත්තටම ඉන්නේ කෙහොමද හොස්පිටල් එකට ගිහින් බලන්න. අත්‍යවශ්‍ය බෙහෙත් නැහැ. ඇත්තටම අපිට කතා කරන්න බැහැ. ජනතාව පල්ලෙහාටම වැටිලා තියෙන්නේ. ජනතාව මැරෙනවා බෙහෙත් නැතුව. මේක තේරෙන්නේ නැහැ. ඊයේ බලංගොඩ උද්ඝෝෂණයක් වෙලා තිබුනා.සමගි ජන බල වේගයේ කට්ටිය බලාගෙන ඉන්නවා. උද්ඝෝෂණය කරන්නේ ඔක්කොම ඡන්දෙ දීපු අය තමයි ගෝහෝම් කියන්නේ.මේ අය ඉක්මනට ගියොත් ජනතාවට සහනයක් හම්බවෙයි.යන්න පරක්කු වෙන්

පරක්කු වෙන් ජනතාව අපහසුතාවයට පත් වෙනවා. අපි කියනවා බක්මනට යන්න කියනවා.මේක පරක්කු කරලා ජනතාව අපහසුතාවයට දාන්න එපා. විපක්ෂය වශයෙන් අපි අපේ බලවත් කණගාටුව රජයට ප්‍රකාශ කරනවා. රඹුක්කන වෙච්ච සිද්ධියට බලවත් කණගාටුව අපි ප්‍රකාශ කරනවා.

**ගරු මන්ත්‍රී - එච්.සජිත් දේවප්‍රිය සිල්වා මහතා**

අද අප්‍රේල් මාසයේ 21 වෙනිදා අදට පාස්කු ප්‍රහාරය සිදු වෙලා අවුරුදු 03 ක් ගත වෙලා. ස්වරගස්ථ වූ ඒසියලු දෙනාටම අපගේ ශෝකය එල කරනවා. අපේ සියාත් මන්ත්‍රීතුමා කිව්වා රඹුක්කන සිද්ධියේ එක්කෙනෙක් මරලා කියලා. එතකොට පාස්කු ප්‍රහාරය වෙලාවෙදි ඒ කතා ගැන එක්කෙනෙක්වත් මෙතන කතා කරේ නැහැ. එදා දෙසීය හැට ගානක් මැරෙන වෙලාවේ කවුරුත් කතා කරේ නැහැ. දැන් මේ වෙලාවේ මහින්ද රාජපක්ෂ මහත්තයාගේ වෙලාවේදී කතා කරනවා.

**සභාවේ ඝෝෂා**

**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**

මන්ත්‍රිවරු ඔය කට්ටිය කතා කරන කොට එතුමලා අහගෙන හිටියනේ.එතුමට කතා කරන්න දෙන්න.

**ගරු මන්ත්‍රී - අල්හාජ් පී.එම්.එම්.උස්මාන් මහතා**

රටේ වෙන ප්‍රශ්නයක් තියෙනවා.මෙතන අපි ඇවිල්ලා ඉන්නේ ජනතාවට සේවයක් කරන්න. නැතුව මරාගන්න නෙමෙයි. ඔබතුමා හරි ඔබතුමාට වැරද්දක් කියන්න බැහැ. ඔබතුමා කරපු වැරැද්ද මොකද්ද දන්නවාද.

**ගරු මන්ත්‍රී - එච්.සජිත් දේවප්‍රිය සිල්වා මහතා**

මම කිව්වේ වැරැද්දක් නෙමෙයි. එදා ඒ වගේ පසුබිමක් ඒ රටේ තිබුනා. මේ මරදාන සිද්ධියේදි පොලිසියෙන් වෙඩි තියලා හතරක් මැරුණා. මමත් මන්ත්‍රි කෙනෙක් එදා වරායේ උද්ඝෝෂණය වෙලාවේ මමත් හිටියා.මම හොඳටම දන්නවා එතන එදා ජේ. වී.පී එකට වැඩ කරන හතර පස් දෙනයි හිටියේ.එතන වෙන අරමුණකින් ඉන්න අයත් හිටියා. ඒක වෙනම දෙයක් .ඒ අය තමයි ජනතාවට ප්‍රකෝපකාරි විදිහට හැසිරෙන්න උඩගෙඩි දෙන්නෙ.පොලීසියටත් ගහනවා .අපේ රටේ මුර දේවතාවෝ.ඒවගේ කලහකාරී සිදුවීම් නවත්තන්න කඳුළු ගෑස් ගහන්න වෙනවා.අවම බලය යොදවනවා ඊයේ නීතිඥවරු අවම බලය විවිධ විදිහට විග්‍රහ කළා.සාධාරණ විදිහට උද්ඝෝෂණය කරන්න ඕන .එතන තෙල් බවුසරය ගිනි ගත්තානම් ලොකු හානියක් වෙන් තිබුණා . අපිත් දැන් මේ රටේ තියෙන තත්ත්වය සම්බන්ධයෙන් අපේ විරෝධය දක්වන රතු එළියක් තමයි ආණ්ඩුවට මේ දක්වලා තියෙන්නේ.මේ වෙලාවේ වෙන් ඕන රටේ උද්දමනය පාලනය කරගන්න.

**සභාවේ ඝෝෂා.**

**ගරු මන්ත්‍රී - එච්.සජිත් දේවප්‍රිය සිල්වා මහතා**

මගේ කොට්ඨාශය අඩු පාඩු මම හදාගන්න ඕනේ.බෙරවා ඇළට ගහක් වැටිලා තියෙනවා.ඒක තවම කපලා නෑ. ලොකු වැස්සක් ආවොත් මුළු පළාතම යට වෙනවා.මගේ කොට්ඨාශයේ බෙරවා ඇළ තියෙනවා.මුලින්ම අපි අපේ නගර සභා සීමාව හදාගෙන ඉන්න ඕන. අපිත් මේක අමාරුවෙන් කරගෙන යනවානේ.අපේ නගර සභා සේවකයින්ට වැටුප් ගෙවන්නේ අපේ බල ප්‍රදේශයේ එකතු වෙන මුදල් වලින් .ඊට පස්සේ තමයි එකෙන් කොටසක් පළාත් පාලන දෙපාතර්මේන්තුවත් අපිට කොටසක් ගෙවන්නේ.

මම කියන්නේ මේකෙ ලේකම්තුමා ඉන්නවනේ. ලේකම්තුමා දැනගන්න ඕනේ මේකෙ නගරාධිපතිතුමා කියන කියන පදේට නටන්නේ නැතුව වැඩ කරන්න. ආණ්ඩුවත් අන්න ඒ වගේ.

**ගරු මන්ත්‍රී - එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා**

නාගරික මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරියනි, ලේකම්තුමනි, මම හිතන්නේ අද රටේ ලොකු ප්‍රශ්නයක් තියෙනවා. ඒක කවුරුත් පිළිගන්න ඕනා. ඒක නිසානේ හැමතැනම පෙළපාලි යන්නේ උද්ඝෝෂණ කරන්නේ මේ රටේ මිනිස්සුන්ට සහනයක් ලැබිලා නැහැ කියන එකයි. සහනයක් ලැබෙනවද නැද්ද කියන එක සාමාන්‍ය දුප්පත් ජනතාව දන්නේ නැහැ. හැටනම ලක්ෂයක් ගෝඨාභයට ඡන්දෙ දුන්නට සජිත් මහත්තයටත් ඡන්දෙ දුන්නා. අද ඒ පනස් අට ලක්ෂයම එදා සිටම ගෝඨාභය මහත්තයා මොන විදියට කරත් ඒ පනස්අට ලක්ෂෙ විරුද්ධයි.

**<u>ගරු මන්ත්‍රී - අල්හාජ් පී.එම්.එම්.උස්මාන් මහතා</u>**

නැහැ ඇක්ලන්ඩ් මන්ත්‍රීතුමා, මුළු රටේ ඉන්න සමස්ථ ජනතාවම විරුද්ධයි. ඒ වගේම පනස්අට ලක්ෂය විතරක් නෙමෙයි සමස්ථ ජනතාවම පීඩනයට පත් වෙලා තියෙනවා.

**<u>ගරු මන්ත්‍රී - එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා</u>**

මේ පීඩනයට පත් වෙලා තියෙන්නේ තෙල් නැහැ, ගෑස් නැහැ, විදුලිය නැහැ, පිටි නැහැ ඒ කාරණාවල් හතර නිසා. ඒ කාරණාවල් හතර සම්පූණර් කරොත් ඉතුරු ටික කොහොමත් අපිට බේරගන්න පුලුවන්. ඉතින් ඒකට තමයි මේ විරුද්ධ පක්ෂයේ හැම කෙනෙක්ම දඟලන්නේ. මේක ගෝඨාභය මහත්තයා කරා වැරදියි කියමු. දැන් ගෝඨාභය මහත්තයා කතා කරානේ 113 ක් හදාගෙන ඇවිල්ලා මේ ආණ්ඩුවක් හදලා කැබිනට් එකක් හදලා මේ ප්‍රශ්නය විසඳන්න.

**<u>ගරු මන්ත්‍රී - අල්හාජ් පී.එම්.එම්.උස්මාන් මහතා</u>**

ඒක නෙමෙයි ප්‍රශ්නෙ එයා කරපු අපරාදේ එයා ඉල්ලා අස්වෙන්න ඕනා.

**<u>ගරු මන්ත්‍රී - එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා</u>**

හරි මං අහන්නේ ඉල්ලලා අස්වෙලා කවුද භාර ගන්නේ.

**<u>ගරු මන්ත්‍රී - අල්හාජ් පී.එම්.එම්.උස්මාන් මහතා</u>**

ඒක අපිට අදාළ නැහැ කුමාර වෙල්ගම ඇමතිතුමා කිව්වා .නගර සභාවේ හරි ප්‍රාදේශීය සභාවේ එක්කෙනාව ජනාධිපති කරන්න. රට විනාසයක් කරන්න යනවා කියලා. කුමාර වෙල්ගම අනතුරු ඇඟෙව්වා දවසක්.ගහේ මුල හරියට තියෙන්න ඕන.දවස් 52 ආණ්ඩුවෙන් තමයි කිතුණු ජනතාව අමු අමුවේ මරලා දාලා මේ ආණ්ඩුව ගත්තේ. ඒක හින්දා ඔබතුමාගේ වයසටයි, කිතුණු ජනතාවයි වෙනුවෙන් කතා කරන්න ඔබතුමා.

**<u>ගරු මන්ත්‍රී - එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා</u>**

දැන් තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කාලෙනේ ඒක සිද්ධ වුනේ.

**<u>ගරු මන්ත්‍රී - එම්.එස්.මොහමඩ් මුස්ෆීර් මහතා</u>**

ඕවා දැන් කතා කරලා වැඩක් නැහැ.

**<u>ගරු මන්ත්‍රී - එච්.සජිත් දේවප්‍රිය සිල්වා මහතා</u>**

සැත්තැම්බර් මාසේ 26 වෙනිදායින් පස්සේ ආණ්ඩුව ගත්තේ ඒ කියන්නෙ පාස්කු ප්‍රහාරයෙන් පස්සේ.

**<u>ගරු මන්ත්‍රී - අල්හාජ් පී.එම්.එම්.උස්මාන් මහතා</u>**

මහින්ද රාජපක්ෂට කතා කරන්න ඕගොල්ලන්ට ලැජ්ජ නැද්ද. මහින්දලාට කඩේ යන්නේ ඇයි. ලැජ්ජාවක් තියෙන්න ඕනේ.

**<u>ගරු මන්ත්‍රී - එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා</u>**

රටේ තියෙන්නේ ආහාර ප්‍රශ්නයක්.

**<u>ගරු මන්ත්‍රී - අල්හාජ් පී.එම්.එම්.උස්මාන් මහතා</u>**

ආහාර ප්‍රශ්නෙ විතරද තියෙන්නේ.

**<u>ගරු මන්ත්‍රී - එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා</u>**

ආහාර ප්‍රශ්නෙ නෙමෙයි දැන් තියෙන්නේ ඕගොල්ලන්ගේ බලය ඇල්ලීමේ ප්‍රශ්නෙ දැන් තියෙන්නේ. එහෙනම් බලය ගන්න තිබුණනේ. දැන් සජිත්ට ගිහිල්ලා අගමැතිකම ගත්තානම් හරිනේ. රට බේරන්න කියන්නේ කොහොමද. අර තෙල් බවුසරේට ගිනි තිබ්බානම් රට බේරෙනවා. ඒකෙන් දහස් ගණන් මැරුණානම් ඕගොල්ලෝ කියන්නේ පොලිසිය නිදාගෙනද හිටියේ කියලා.

**<u>ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා</u>**

ඒයා වෙඩි තිබ්බේ එහා මීටර් 700 ක් එහා.

<u>**ගරු මන්ත්‍රී - එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා**</u>

ඔයානේ මරණ පරීක්ෂක. ඔයා මරණ පරීක්ෂණය කරේ. මං එකයි කියන්නේ දැන් ඕගොල්ලෝ හදන්නේ බලය ලබා ගන්න බොරදියේ මාළු බාන්න. මිනිස්සුන්ගේ සාගතේ ගැන කතා කරනවා නෙමෙයි. දැන් රඹුක්කන මරණ පරීක්ෂණය ඕගොල්ලො කරලා තියෙන්නේ.මතක තියා ගන්න 53 හතර්ාලෙදි 8 දෙනෙක් මැරුම් කැවා. 66 දඹරාවේ රතනසාර හාමුදුරුවෝ වෙඩි කාලා මැරුවා. විජේසූරිය සහෝදරයා විශ්ව විද්‍යාල ශිෂ්‍යයෙක්. විජේසූරිය සහෝදරයව වෙඩි තියලා මරලා දැම්මා. තට්ටුවලින් පහළට දාලා මරලා දැම්මා. ඔය මරපුවා කියන්න ගියොත් අපිටත් කියන්න පුලුවන්. දැන් ඕගොල්ලෝ මරපුවා හොඳයි. ඕගොල්ලෝ ආණ්ඩු කාලේ මරපුවා ඔක්කොම හරි. රටේ තියෙන්නේ ආහාර ප්‍රශ්නයක්. අයි.එම්.එෆ්. එකට ගිහිල්ලා සහනයක් කරොත් මිනිස්සුන්ට මේ කියන දේවල් නැහැ. තමුන්නාන්සේලාට තියෙන්නේ බලය ලබා ගන්න. අපි අහන්නේ කාටද මේකේ බලය දෙන්නේ.

<u>**ගරු මන්ත්‍රී - අල්හාජ් පී.එම්.එම්.උස්මාන් මහතා**</u>

මට කවුරුත් එපා. මම කිසිම දේශපාලන පක්ෂයකට අදාළ නැහැ. මම ජනතා නියෝජිතයෙක්. ජනතාවගේ පැත්තේ ඉන්නේ. ඕගොල්ලෝ ආණ්ඩු බලය ගන්නයි, මැති ඇමතිකම් ගන්නයි වැඩ කරන්නයි ඒකට තමයි ඕගොල්ලෝ ඉන්නේ. මම එහෙම නැහැ මම ජනතාවගේ පැත්තේ.

<u>**ගරු මන්ත්‍රී - එච්.සජිත් දේවප්‍රිය සිල්වා මහතා**</u>

225 ම එපා කියනවා නම් කාටද බලය දෙන්නේ.

<u>**ගරු මන්ත්‍රී - එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා**</u>

කාටද බලය දෙන්නේ. බලය අරන් කවුද කරන්නේ. විශ්වාසභංග යෝජනාවක් ගේනවා. ඒකට ඡන්දෙ දෙන්න ඔක්කොම කැමති නැහැනේ. සජිත් එක පැත්තක. මෛත්‍රී එක පැත්තක. අනිත් කට්ටිය වශ්වාසභංග යෝජනාවක් දිනන්නේ කොහොමද. ආණ්ඩුව විශ්වාසභංග යෝජනාව දිනුවොත් ඒක වාසියත් ආණ්ඩුවට.

<u>**ගරු මන්ත්‍රී - අල්හාජ් පී.එම්.එම්.උස්මාන් මහතා**</u>

මේ ජනතා මතයට කන් දෙන්න. ජනතාව ඡන්දයක් දීලා තමයි අපි ඔක්කොම පත්වෙලා ඉන්නේ.

<u>**ගරු මන්ත්‍රී - එම්.එෆ්.එම්.හසන් මහතා**</u>

සභාපතිතුමා, හිතට එකඟව මේක හදන්න ඕන. ව්‍යවස්ථාව හදන්න ඕන. මුලින්ම ප්‍රශ්නය දේශපාලඥයෝ හදන්න කලින් රටේ නිලධාරීන් හදන්න ඕනේ. නිලධාරීන් හදන්නේ නැතුව මේ දේශපාලඥයෝ හදන්න බැහැ. සියයට සීයක්ම දෙන්නේ.නිලධාරීන් තමයි හැම හොර වැඩකටම මූලිකත්වයක් දෙන්නේ.

<u>**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**</u>

ඔබතුමා ඒ කියන්නේ නිලධාරීන්ව මීට වඩා හදන්න ඕන කියලද කියන්නේ.

<u>**ගරු මන්ත්‍රී - එම්.එෆ්.එම්.හසන් මහතා**</u>

නිලධාරියා හදන්න ඕන කියන්නේ හොරකම් කරපු එක්කෙනෙක් අහු වුනොත් එයාට ප්‍රජා අයිතිය නැති කරන්න ඕනා. ඒ අයගේ පරම්පරාවටම් රජයේ රස්සාවල් නැති කරන්න ඕන.අනිත් එක දරුණු විදියට මේ නීතිය ආවොත් තමයි මේ රට හදන්න පුලුවන්. නැත්නම් දේශපාලඥයෝ හොරකම් කරන එක හොරකම් කරනවා. හැම නිලධාරියෙක්ම 90% ක්ම හොඳ නිලධාරීන් ඉන්නේ නිලධාරීන් වශයෙන්. 10% ක් හොරු ඉන්නවා. හැම පක්ෂෙම ඉන්න හොරු අල්ලන්න ඕනා. අපි හොරාට හොරා කියලා කියනවා.ඒ අයට දඩුවම් දෙන්න ඕන.හොරාට හොරා කියන්න අපිට ඒ ශක්තිය තියෙනවා. හොඳ මිනිස්සුන්ට හොඳ මිනිස්සු කියනවා.

<u>**ගරු මන්ත්‍රී - එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා**</u>

මහ බැංකුව හොරා කාපු එක්කෙනෙක්වත් දැන් නැහැනේ.

<u>**ගරු මන්ත්‍රී - එම්.ජේ.එච්.ඒ.පද්මකාන්ති මිය**</u>

මම මේ කියන්නේ අපිට හොරාට හොරා කියන්න මෙතුමන්ලා ඉඩ දෙන්නේ නැහැනේ. ඇත්තටම අපි ආවේ රට හදන්න ඉස්සෙල්ලා ගම හදන්න. එතනින් අපි පටන් ගන්න ඕනේ. නැත්නම් මේ මිනිස්සු

පාලර්මේන්තුවේ මන්ත්‍රීවරුන්ට ගහනවා වගේ අපිටත් ගහයි ඇවිල්ලා. ඒ හින්දා අපි අපේ ගම හදමු. ගම හැදුවේ නැත්නම් අපිට ගුටි කන්න වෙයි දැන් ඉන්න මාස ගානට.පාලර්මේන්තුව කරන්නෙත් ඒ පැත්තේන මේ පැතුතෙන් වාද කරනවා.අපිත් ඒ තත්ත්වයට පත් වෙන්න ඕන නැහැ. මම ඇත්තටම කණගාටු වෙනවා අපේ සභාවේ මන්ත්‍රීතුමන්ලා සවන් දීමේ හැකියාව නොමැතිකම. මොකද අපි හැමෝටම අයිතියක් තියෙනවා කතා කරන්න. ඒ වගේම අනිත් අයට අහන් ඉන්න පුලුවන් වෙන්නත් ඕනේ. නැත්නම් කතා කරන්න බැහැනේ.
ඊළඟට ගරු සභාපතිතුමනි මට තියෙන ප්‍රශ්නේ මේකයි. එකක් අපේ නගර සභාවේ පෙර පාසල ගැන. පෙර පාසලේ ඉස්ලාම් පන්තියෙයි, සිංහල පන්තියෙයි ගුරුවරු දෙන්නා ගොඩක් අසමගියෙන් ඉන්නේ. ඒක ගොඩක් වෙලාවට දෙමාපියන්ට බලපාලා තියෙනවා.

**ගරු මන්ත්‍රී - අල්හාජ් පී.එම්.එම්.උස්මාන් මහතා**
මන්ත්‍රීතුමි, ඒක ඔබතුමිය ඉන්න මන්ත්‍රී කෙනෙක් එක්ක කතා කරලා සුහදව උස්මාන් මන්ත්‍රීතුමා එන්න මෙහෙම ප්‍රශ්නයක් තියෙනවා කියලා අපි දෙන්නම එකතු වෙලා ඒක නිරාකරණය කරලා දාමු. ඕන වෙලාවකට මට අඩගහන්න. මම එන්නම් ඒක කිසිම ගැටලුවක් නැහැ.

**ගරු මන්ත්‍රී - අල්හාජ් එම්.ඒ.එම්.අරූස් මහතා**
ඔබතුමිය ඒ ගැන පැහැදිලි කරන්න.

**ගරු මන්ත්‍රී - එම්.ජේ.එච්.ඒ.පද්මකාන්ති මිය**
මම ඒක තමයි කිව්වේ සභාපතිතුමාගෙනුත් ඉල්ලන්න හදන්නේ. අපි පොඩ්ඩක් ඒක ගැන සොයලා බලමු. මොකද මෙතන ළමයින් 50 ක් නැහැ.

**ගරු මන්ත්‍රී - අල්හාජ් පී.එම්.එම්.උස්මාන් මහතා**
මන්ත්‍රීතුමිය අපි මේක කතා කරමු. මේක සුළු දෙයක්. අපේ ගමේ ජනතාව ඔයාගේ ගමේ ජනතාව අපිට ඇහුම්කන් දෙනවා මේක මෙතන කතා කරන්නේ නැතුව ඔබතුමිය මට කතා කරන්න මම එන්නම් ඒක කතා කරන්න.

**ගරු මන්ත්‍රී - එම්.ජේ.එච්.ඒ.පද්මකාන්ති මිය**
මගේ යුතුකම ඒ ගැන දැනුවත් කරන එක.

**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**
නැහැ නැහැ මේ ප්‍රශ්නෙ මට ආවා. මේ ප්‍රශ්නෙ අවුරුද්දක් තිස්සේ තියෙන ප්‍රශ්නයක් ඒක. මොකද, මේ අර මුස්ලිම් ටීචර් ආවට පස්සේ තමයි අපේ තත්ත්වය උසස් වුනේ. පෙර පාසලට ළමයි වැඩිපුර ආවේ ඒ ටීචර් ආවට පස්සේ.

**ගරු මන්ත්‍රී - එම්.ජේ.එච්.ඒ.පද්මකාන්ති මිය**
එයා උගන්නනවා හොඳයි.

**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**
අපිත් මේක අද ඊයේ ආපු කට්ටිය නෙමෙයිනේ. එදා ඉදලා මේකෙ වෙන්නේ මොනවද කියලා අපිත් බලාගෙන තමයි ඉන්නේ. නමුත් මෙතන ඒ දෙන්නා අතර පරස්පර ගැටුමක් තියෙනවා. මොකද, මෙතන මෙයා මූලික වෙලා කටයුතු කරනවට එයා කැමති නැහැ. එයා මූලික වෙලා කටයුතු කරනවට මෙයා කැමති නැහැ. ඒකයි වෙලා තියෙන්නේ. දැන් අපේ බේරුවල පෙර පාසල තමයි පෙර පාසල් අතරින් හොඳ ස්ථාවර තත්ත්වයට ඇවිල්ලා තියෙන්නේ. ගොඩක් ත්‍රීවිලර් වලට හයර් ගෙවාගෙන දුප්පත් අම්මලා තාත්තලා මේ සභාවට එවන්නේ. අපේ ඒ ළමයින්ට හොඳ අධ්‍යාපනයක් ලබා දෙන හින්දා. ඉතින් අපි මෙතන ඒ දෙන්නවම තියාගන්න ඕන විදියට තමයි වැඩ කරන්න ඕනේ.

**ගරු මන්ත්‍රී - එම්.ජේ.එච්.ඒ.පද්මකාන්ති මිය**
සභාපතිතුමා ඒකට අපේ අධීක්ෂණය පොඩ්ඩක් වැඩි කරමු.

**<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>**
තුන්හතර පාරක් මට කියන්න පුලුවන් හැටියට මම කිව්වා. ඒගොල්ලෝ හදා ගත්තේ නැත්නම් මට අස් කරන්න වෙනවා දෙන්නවම.එහෙම පෙර පාසල් කඩාගෙන වැටුණානම් අනිත් පෙර පාසල්වලට වාසිදායක වෙනවා.

**<u>ගරු මන්ත්‍රී - එම්.ජේ.එච්.ඒ.පද්මකාන්ති මිය</u>**
මෙතන ප්‍රශ්නෙ තියෙන්නේ ගරු සභාපතිතුමා සිංහල ගුරුතුමියගේ තමයි. දෙමව්පියෝ කැමති නැහැ.

**<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>**
භේදයක් ඇති වෙන්න හොඳ නැහැ එකට යන්න ඕනේ.

**<u>ගරු මන්ත්‍රී - එම්.ජේ.එච්.ඒ.පද්මකාන්ති මිය</u>**
ඇත්තටම පෙර පාසලකට ළමයින් දාන්නේ සමාජයකට හුරු කරවන්නයි. හුරු කරවනවා කියන්නේ ගෙදර ඉන්නවා වගේ දවස තිස්සෙම කකා බිබී ඉන්න එක නෙමෙයි. ඒ හික්මීම මෙතන අඩුයි. ඊට පස්සේ ඉස්කෝලෙට ගියාමත් ඒ පුරුද්ද නවත්තගන්න බැහැ. මම කියන්නේ මේක නිවැරදි කරන්න අපි ඒගොල්ලන්ව දැන්වත් කරමු. මෙහෙම වුනොත් අපිට ළමයින් නැති වෙයි කියලා.

**<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>**
අනිවායෙර්න් දැනුවත් කරන්න. ලේකම් තුමා මේ දෙන්නව ගෙනල්ලා අවවාද කරන්න.

**<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>**
නැති ප්‍රශ්නයක් එනවා. ඊට පස්සේ කඩාගෙන වැටෙනවා.

**<u>ගරු මන්ත්‍රී - එම්.ජේ.එච්.ඒ.පද්මකාන්ති මිය</u>**
ඒක පොඩ්ඩක් හොයා බලමු. ඒ වගේම ගරු සභාපතිතුමා තව දෙයක් තියෙනවා. පුස්තකාලයේ තියෙනවා පාඨක සමාජ තරඟ. ඒ තරඟවලට ඇතුළත් කර ගන්නේ සාමාජිකත්වය තියෙන දරුවෝ විතරයි. ගොඩක් වෙලාවට බේරුවල නගර සීමාවෙන් පිට දරුවොන්ට සාමාජිකත්වය ගන්න ඇපකාරයෙක් ඕනනේ නගර සීමාව ඇතුළේ. ඒක දරුවන්ට ලොකු අවාසියක්. ඒක හින්දා පිටින් එන අය සාමාජිකත්වය ගන්න උනන්දු වෙනවා අඩුයි.

**<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>**
මොකක්ද කරන්න ඕනේ ඒකට අපි.

**<u>ගරු මන්ත්‍රී - එම්.ජේ.එච්.ඒ.පද්මකාන්ති මිය</u>**
ඒක හින්දා මම ඉල්ලන්නේ බේරුවල ප්‍රාදේශීය ලේකම් අදාල විදියට ලොකු අයට නෙමෙයි දරුවොන්ට විතරක් එහෙම ලොකු දෙයක් නැතුව සහභාගි වීමේ අවසරය ලබා දෙන්න බැරිද කියලා.

**<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>**
එතකොට කට්ටිය වැඩි වෙයිනේ.

**<u>ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා</u>**
මට ලියුමක් ආපු හින්දා මම කියන්නේ. ඇත්තටම මාත් රෙකමන්ඩ් කරනවා ඒක. කවුරු හරි ආවොත් මමත් කවුද කියලා බලන්නේ නැහැ පුස්තකාලේ දන්න හින්දා මම ඕන කෙනෙක්ට අත්සන් කරලා දෙනවා. එයා පොත් දෙකක් අරන් රිටන් කරලා නැහැ. මම අත්සන් කරේ ලොකු කෙනෙක්ට නෙමෙයි. ඕලෙවල් කරන එක්කෙනෙක් නෙමෙයි එයා ඇවිල්ලා පොත් අරගෙන එහෙම්මම ගිහිල්ලා. ඉස්කෝලෙ දහය වසරේ පොත් අරගෙන ගිහිල්ලා. ඒක රිටන් කරලා නැහැ.

**<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>**
එයාගේ ඇඩ්රස් එක තියෙනවානේ.

<u>**ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා**</u>
ඊට පස්සේ මටත් ඒ ලියුමේ කොපිය එවලා තිබ්බා. අපිට ඒ අයට ඩිපොසිට් එකක් තියාගන්න පුළුවන්නම් හරි.බේරුවල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ අයට.

<u>**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**</u>
ඒක ඒකච්ඡන්දයෙන් සම්මතයි.

<u>**ගරු මන්ත්‍රී - අල්හාජ් එම්.ඒ.එම්.අරූස් මහතා**</u>
ගරු සභාපතිතුමා, ඔබතුමා ගිය සභා වාතර්ාවේ සටහන් කරනවා මම දෙමළෙන් ඒක කියන්නම්.
සුපර් මාකර්ට් වලට ගියාලු රත්ති කිරි පැකට් හොයන්න ග්‍රෑම් 100 කිරි පැකට් 5 න් පස්සේ තමයිලු එයාට හම්බුනේ. සභාපතිතුමාට තේරිලා තියෙනවා දැන් මේක හොඳටම වැටිලා තියෙන්නේ කියලා.
සභාපතිතුමා, ඔබතුමා ගැන මට හරි කණගාටුයි. ඒ කියන්නේ ගරු සභාපතිතුමා 16 වෙනිදා කෝල් එකක් දුන්නා ගරු මන්ත්‍රීතුමා ටැංකි 04 ක් අරගන්න. ඔයා රිසිට් එකක් කඩා ගන්න කියලා. ඇත්තටම මම එදා රිසිට් එකක් කඩා ගත්තා. අපේ ගරු ලේකම්තුමාටත් කිව්වා අරගන්න කියලා. ඇත්තටම ගරු සභාපතිතුමා මිනිස්සු පාරේ යන්නේ කා වෙනුවෙන්ද. අපිට අපේ දරුන්ට කිරි පැකට් එකක් ඉල්ලලා. අපිට තෙල් මිල අඩු කරන්න කියලා. සම්සථ ජනතාවම අපහසුතාවයට පත් වෙලා තියෙන වෙලාවේ ඒගොල්ලන්ට සහනයක් දෙන්න කියලා මේ පාරෙන් යන මිනිස්සුන්ට වතුර ටිකක් තියන්න තමයි මම වතුර ටැංකි ටිකක් ඉල්ලුවේ. ඔබතුමා කෝල් එකක් අරන් කිව්වා ඔබතුමාට මම කෝල් ගත්තා ගත්තා ආන්සර් කෙරුවේ නැහැ. ලේකම්තුමා කිව්වා අරගෙන යන්න කියලා. ඊට පස්සේ මමත් ලොරියක් අරගෙන ආවට පස්සේ අතන මම රිසිට් එකක් කඩලා තියෙනවා. අපි ගුණාත්මක දේශපාලනයක් මේ රටේ අවුරුදු 32 ක් විතර කරගෙන ඉන්නවා. අපිටම කියලා වෙන ගුණයක් හදලා තියෙනවා. අනිත් එක ඔබතුමා කොහොම කිව්වත් හරි ගරු සභාපතිතුමා අපේ කොයි පක්ෂෙන් ඉල්ලුවත් වතුර ටැංකියක් දෙන්න ගරු සභාපතිතුමා. අපිට රිසිට් එකක් කැඩුවා නම් අපි අපේ සභාවෙන් හැම රැස්වීමකටම කොඩි කණු දෙනවනේ සභාපතිතුමා. දෙන්නේ නැතුව ඉන්නේ නැහැනේ. හෙට මජරින් මහත්තයා අතන වතුර ටැංකියක් තියන්න කිව්වොත් ඔබතුමා තියනවනේ. පියල් ඇමතිතුමා තියන්න කිව්වොත් තියනවනේ. මමත් කියන්නේ තියන්න කියලා. දැන් ඊට වඩා ගුණාත්මක සමාජයක් තියෙන්නේ.දැන් ගෝලෆේස් එකට ගියානම් සටන් පාඨ බලන්නකෝ ගරු සභාපතිතුමා. ගිටාර් එක ගහගෙන කවි කියාගෙන ලස්සන සටන් පාඨ. කිසිම ප්‍රශ්නයක් නැතුව තමන්ගේ මනසේ තියෙන දුක, අදෝනාව මිනිස්සුන්ට තියෙනවා ගරු සභාපතිතුමා. අන්න එහෙම තියෙන කාලෙක අපි වෙනස් වෙන්න ඕනෙ ගරු සභාපතිතුමා. අපි ඔක්කොම වෙනස් වෙන්න ඕනේ.

<u>**ගරු මන්ත්‍රී - එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා**</u>
එදා හිරුණිකා ප්‍රේමචන්ද්‍ර කිව්වේ ප්‍රිතියෙන් එහෙම ඉන්න එක වැරදියි කියලා.

<u>**ගරු මන්ත්‍රී - අල්හාජ් එම්.ඒ.එම්.අරූස් මහතා**</u>
ගරු ඇක්ලන්ඩ් මන්ත්‍රීතුමා, ලෝකයේ අලුත් සංස්කෘතියක් තියෙනවා. අන්න ඒ නිසා මම ගරු සභාපතිතුමාට කියන්නේ මීට පස්සේ මම නෙමෙයි කවදා හරි ඔබතුමා මේ පුටුවෙන් මේ පැත්තට එන්න පුලුවන්. ඔබතුමා දැන් නගරාධිපති වෙලා ඉන්න පුලුවන්. වෙන එක්කෙනෙක් ඒ වෙලාවේ ඉන්න පුලුවන්. ඒ කියන්නේ මේ රටේ අපි ඔක්කොම එක්සත් වෙලා අපි තනි පක්ෂයක් විදියට සමගි ජන බලවේගෙට මේක හදන්න බැහැ. මේ පොහොට්ටුවට හදන්න බැහැ. මුළු සමාජයම තමයි මේක හදන්න ඕනේ. අපේ රට අන්තිම අගාදයට වැටිලා තියෙන්නේ. අපි වෙනස් වෙන්නේ නැතුව මේක හදන්න බැහැ. අපි වෙනස් වෙන්න ඕනේ.
1953 අපේ රටේ හතර්ාලේ ආවා. ඩඩ්ලි සේනානායක මහත්තයා අගමැති පුටුවේ වාඩි වෙලා හිටියා සත 25 ක් තමයි වැඩි කරේ හාල්වලට. මේ රටේ මිනිස්සු ගිහිල්ලා වාඩි වෙලා සත්‍යාග්‍රහයක් තියලා බැහැලා යන්න කිව්වා. බැහැලා ගියා. ඊට පස්සේ සර් ජෝන් කොතලාවල මහත්තයට අගමැති ධූරය දීලා ගියා. අන්න ඒ නිසා තමයි ගරු සභාපතිතුමා සමස්ථ මිනිස්සුම කියනවා පොහොර ප්‍රශ්නයේදි කිව්වා මේක හරියන්නේ නැහැ කියලා. ජනාධිපතිතුමා එදා ඇවිල්ලා කියනවා එයා ජාතියෙන් සමාව ඉල්ලනවා කියලා.

<u>**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**</u>
88 ,89 භිෂණයෙන් පස්සේ තමයි රටේ ණය බර වැඩි උනේ.

<u>**ගරු මන්ත්‍රී - අල්හාජ් එම්.ඒ.එම්.අරූස් මහතා**</u>
1977 වෙනකන් මේ රටේ ඩොලර් සංචිතය රුපියල් 7 යි. 1977 න් පස්සේ ජයවධර්න මහත්තයා මේ රට ගන්නකොට ඒවෙලේම රු.14 ට යනවා ඩොලර් එක දෙගුණයක් වැඩි කරනවා. මේ වගේම තමයි ආවේ. ඒ කියන්නේ 1948 ඉදලා පාලනය කරගෙන ආපු 1977 වෙනකන් පාලනය කරගෙන ආපු රු.7 කට තිබුන ඩොලර් 77 න් පස්සේ ජයවධර්න මහත්තයා මේ ආණ්ඩු බලය ගත්තට පස්සේ රු.14 වෙනවා. එක ගුණයක් වැඩි වෙනවා. විවෘත ආථර්ීක සිස්ටම් එකෙන්. අපිටම කියලා වෙනම එකක් තිබුනා මේ රටේ. අපේ රටේ මොකද්ද අඩු වෙලා තියෙන්නේ. කෘෂිකාමර්ිකයෝ ඉන්නවා 28% ක්. කෘෂිකාමර්ික ඉඩම් තියෙනවා 10% ක්. හොඳ මානව ගංගාවල් 103 ක් තියෙනවා. හොඳ කාලගුණ තත්ත්වයක් තියෙනවා. ඇයි මේක හදා ගන්න බැරි වෙලා තියෙන්නේ. අපි වැරදි වැරදි පාලකයොන්ට අපි දෙන්නේ. වැරදි වැරදි පාලකයොන්ට අපි පාලනය දීලා බලනවා. අපේ මේ රටේ ආචායර් එන්.එම්.පෙරේරා මහත්තයා කොයි වගේ උපාධිධාරියෙක්ද. ආථර්ික විද්‍යාවෙනුත් උපාධිධාරයෙක්. අනිත් එක දේශපාලන විද්‍යාවෙනුත් උපාධිධාරයෙක්. එයා තමයි මුදල් අමාත්‍යාංශයෙන් ඒක කෙරුවේ. කොයි වගේ මුදල් අමාත්‍යවරයෙක්ද. අපේ සාමාන්‍යයෙන් ජෙම් ඇන්ඩ් ජුවලරි එක ලෝකෙට ගෙනිච්චා.අපේ ඩොලර් සංචිතය වැඩි කෙරුවා. ඩොලර් එක බේරගත්තා. පිටරට සල්ලි එන්න පටන් ගත්තා. අන්න එහෙම ආථර්ීක ක්‍රමයක් කෙරුවා. කවුද ගරු සභාපතිතුමා, එන්.එම්.පෙරේරා මහත්තයා හිටපු පුටුවේ සම්පූණර්යෙන්ම මේ ආථර්ීකය වැට්ටුවා. එන්.එම්.පෙරේරා මහත්තයා ගැන කියන්නේ එන්.එම්.පෙරේරා මහත්තයාගේ ගුරා ගැන කියන්නේ මහා බ්‍රිතාන්‍යයේ. එයා මහා බ්‍රිතාන්‍යයේ ඉපදුනා නම් එයා මහා බ්‍රිතාන්‍යයේ අගමැති ධූරයේ අන්න ඒ වගේ මොළයක් තියෙන මිනිස්සු තමයි මේ මහා පුටුවේ වාඩි වෙලා හිටියේ. මේක අපේ රටේ මිනිස්සු සම්පූණර්වම ඇවිල්ලා තියෙන්නේ. අන්න ඒ නිසා මිනිස්සු බලන්නේ තට්ටු මාරු ක්‍රමයක් නෙමෙයි. වෙන දේශපාලන කෝණයකින් බලන්නේ. මිනිස්සු බලන්නේ ජනතාවාදි පාලනයක් පත් කර ගන්න. ඒක මිනිස්සු ප්‍රජාතන්ත්‍රවාදි ඡන්ද ක්‍රමයකින් මේ රටේ මිනිස්සු කවදා හරි පත් කරයි. ගරු සභාපතිතුමා, ඔබතුමාටත් කියන්නේ මම මේ ඉතිහාසය අනුව දේශපාලන ඉතිහාසයක් තියෙනවා. අන්න ඒක නිසා මම එදා වෙච්ච දේ ගැන කණගාටු වෙනවා. ඒ රිසිට් එක තිබුන නිලධාරිවරු අපහසුතාවයට පත් වෙනවා. ඒ කියන්නේ ඉහළින් ඕඩර් එකක් එනකොට දෙන්න එපා කියලා. ඔබතුමා මට නෙමෙයි ඔබතුමා මේ හසන් මන්ත්‍රීතුමා ඉල්ලුවත් දෙන්න වතුර ටැංකියක්.

<u>**ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා**</u>
ඔබතුමා පක්ෂේ නමට නෙමෙයිනේ ඉල්ලලා තියෙන්නේ.

<u>**ගරු මන්ත්‍රී - අල්හාජ් එම්.ඒ.එම්.අරූස් මහතා**</u>
නැහැ මගේ නමට.

<u>**ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා**</u>
එක්කෙනෙක් ඇවිල්ලා එයාගේ නමට ගන්නවා නම් වතුර බොන්නනේ. ඒක නිසා මීට පස්සේ එහෙම එකක් වෙන්නේ නැති වෙන්න බලාගන්න සභාපතිතුමා.

<u>**ගරු මන්ත්‍රී - අල්හාජ් එම්.ඒ.එම්.අරූස් මහතා**</u>
ගරු සභාපතිතුමා, ඔබතුමාම කියනවා කඩවල් 05 කට ගියා කියලා. ඔබතුමාගේ ප්‍රශ්නය වෙනුවෙන් තමයි යන්නේ. මගේ ප්‍රශ්නය වෙනුවෙන් තමයි යන්නේ. මගේ දරුවන්ගේ ප්‍රශ්නය වෙනුවෙන් තමයි යන්නේ. අපි සහනයක් වෙන්න මේකට කටයුතු කරන්න ඕනේ. අන්න ඒ නිසා ගරු සභාපතිතුමා, මේ රටේ ඉගෙන ගත්ත බුද්ධිමත් මිනිස්සු නායකත්වයක් දීගෙන ඉන්නවා. අපිට මාර පුදුමයක් තියෙන්නේ. ඒ නිසා අපි මේ රට ගොඩගන්න ඕනේ. මේ රට අපිට ගොඩ ගන්න බැරි රටක් නෙමෙයි. අපි මේකට අවංකයෙන් වැඩ කෙරුවොත් මේක ගොඩගන්න පුලුවන්. අනිත් එක ගරු සභාපතිතුමා, මම අද කියනවා මීට පස්සේ කොයි මන්ත්‍රී වුනත් හරි එයාගේ රිසිට් එකක් කැඩුවා නම් එයාට ඒ කායර්භාරය කරලා දෙන්න කියලා මම නිහඬ වෙනවා ගරු සභාපතිතුමා.

<u>ගරු මන්ත්‍රී - අහමඩ් දිල්සාත් මහතා</u>

Good afternoon Chairman and the members of the house! This can be sometimes this can be my last speech at the Urban Council. Because, you know we have been given four period of times during the sessions from my division. It is the one of the lowest developed areas. I don’t know how can I go to my people and explain the situation. Once you said that you have done projects in Sri Lanka within short period of timeyou have made the carpet road more than 08 roads. I am so happy about that one. But, very unfortunately not a single carpet road is install at the Gorakaduva division. How can I go and talk to my people when I face the next election? They will chase me away. Right, one of the biggest problems is we have been talking regarding the Garbage issue last four years. Now we have one more year. The present government’s economic crisis will never answer for that one. Four billion applieded IMF International Moritory Fund is doubt means the entire country is finish. So, all depents on that Four Billion. Our Financial Minister Ali Sabry is requesting for billions as short term solution to the entire problem in Sri Lanka. Right now we come to the point of my view here. Last four years what I have done to my division? So, the garbage issue failed one thing. The second thing the drain is totally failed. Right, so my dream library totally finished. So, the four years it went on. One more, who is going to give us the large sum of money for those projects? So, one year the present Urban Council’s financial position also worst than the government.

<u>ගරු මන්ත්‍රී - අහමඩ් දිල්සාත් මහතා විසින් ඉංග්‍රීසි භාෂාවෙන් සිදුකරන ලද කතාවේ සිංහල පරිවර්තනය.</u>

ගරු සභාපතිතුමා ඇතුළු සභාවේ මන්ත්‍රීවරු සියළු දෙනාට සුභ සන්ධ්‍යාවක් වේවා.සමහර වෙලාවට මම මේ සභාවේ කතා කරන අන්තිම වතාව වෙන්න පුළුවන්.ඒ මොකද කිව්වොත් ඕගොල්ලෝ දන්නවා අවුරුදු 4 ක් තිස්සේ සභා වාර වලදි මම මගේ කොට්ඨාසයේ යෝජනා ඉදිරිපත් කළා.නගර සභා බල ප්‍රදේශයේ තියෙන දුෂ්කරම කොට්ඨාසය මගේ කොට්ඨාසය තමයි.මම දන්නේ නෑ මම ඒ මිනිස්සුන්ට කොහොම මුණ දිලා පැහැදිළි කරන්නද කියලා.එක වතාවක් ඔබතුමා කිව්වා කෙටි කාලයක් තුළ පාරවල් 08 ක් කාපට් කරපු එකම නගර සභාව අපේ නගර සභාව කියලා .ඒ ගැන මම සතුටු වෙනවා.නමුත් අවසනාවකට වගේ ඒ පාරවල් වලින් එකක්වත් මගේ කොට්ඨාසයේ පාරවල් නෙවෙයි.මම ඊළඟ ඡන්දයට ආවොත් මම කොහොමද මිනිස්සුන්ට මුණ දෙන්නෙ.ඒගොල්ලෝ මාව පන්නලා දායි. අවුරුදු 04 ක්ති ස්සේ අපි මෙතනදි කතා කරන ලොකුම ගැටළුව තමයි කුනු ගැටළුව.අපිට තව අවුරුද්දක් විතරයි ඉතුරු වෙලා තියෙන්නෙ.දැනට මේ රජය මූණ දෙන ආර්ථික අබර්ුදයත් එක්ක මේකට උත්තරයක් ලැබෙන්නේ නෑ.අයි එම් එෆ් එකෙන් ලංකාව ආධාරයක් වශයෙන් ඉල්ලා තියෙන බිලියන 04 ලැබුනේ නැත්තම් මුළු ලංකාවම ඉවරයි.ඒ නිසා ලංකාවේ අනාගතය තියෙන්නෙ ඒ බිලියන 04 මත .අපේ මුදල් ඇමති අලි සබ්රි මහතා කෙටි කාලින විසඳුමක් ලෙස මේ බිලියන 04 ඉල්ලලා තියෙනවා.

දැන් මගේ කතාවට එනවා. පසුගිය අවුරුදු 04 ක් තිස් මම මගේ කොට්ඨාසයට මොනවද කලේ .කුණු ප්‍රශ්නය අසාර්ථකයි ඒක පළවෙනි එක.දෙවනි එක ඇළ මාගර්ය ඒකත් අසාර්ථකයි. අනිත් එක මගේ පුස්තකාලය .ඒකත් සම්පූණර්නේම ඉවරයි.දැන් අවුරුදු 04 ක් ඉවරයි. තව අවුරුද්දයි තියෙන්නේ.කවුද මේ ව්‍යාපෘති වලට මේච්චර ලොකු මුදලක් දෙන්නේ.දැන් නගර සභාවේ මුදල් තත්ත්වය රජයේ වගේම අබර්ුදයක තියෙන්නේ.

<u>ගරු මන්ත්‍රී - අල්හාජ් පී.එම්.එම්.උස්මාන් මහතා</u>

Sorry for disturbing you. You are here for four years in same seat. Now it’s last year now. That means twelve months. Now only you awaked. You have been sleeping for four years? Now only you awake? At last moment it is no point of talking. The government is under the sea now. Urban Council also same. You are here for four years in same seat. You went to the, what is saying in Sinhala is “Kade Yaama”. You done that job for four years. Now only you realised.

**<u>ගරු මන්ත්‍රී - අල්හාජ් පී.එම්.එම්.උස්මාන් මහතා විසින් ඉංග්‍රීසි භාෂාවෙන් සිදුකරන ලද කතාවේ සිංහල පරිවර්තනය.</u>**

බාධා කළාට සමාවෙන්න.ඔබතුමා අවුරුදු 04 ක් තිස්සේ මේ ආසනයේ වාඩි වෙලා ඉන්නවා.මේ යන්නේ අන්තිම අවුරුද්ද.ඒ කියන්නේ මාස 12 යි ඉතුරු වෙලා තියෙන්නෙ.දැන් තමයි ඔබතුමා ඇහැරිලා තියෙන්නේ.ඔබතුමා අවුරුදු 04 ක් තිස්සේ නිදාගෙනද හිටියේ.අන්තිම මොහොතේ කතා කරලා වැඩක් නෑ.දැන් රජය මුහුද යට ගිලිලා ඉවරයි. නගර සභාවත් එහෙමයි.ඔබතුමා අවුරුදු 04 ක් තිස්සේ මෙහේ ඉන්නවා .ඔබතුමා රජයට කඩේ ගියා.ඒක තමයි ඔබතුමා අවුරු 04 ක් තිස්සේ කළේ.දැන් තමයි ඒක ඔබතුමාට තේරිලා තියෙන්නෙ.

**<u>ගරු මන්ත්‍රී - අහමඩ් දිල්සාත් මහතා</u>**

Let me talk. Within the four years of time we have done little. That means small roads, small small works done. But it's not highlighted at all. Now the government people from the my division, not only here. So, I'm responsible for my Gorakaduva people. Once we open the Facebook all the bad news coming on. Now this present government within the first four, five months couldn't solve this gas issue. They couldn't solve the problem of petrol issue. Now from the Rs. 380.00 the milk packet that is went to Rs. 1,025.00. The government could not control at all. Indian Oil Company IOC, whatever the decision IOC is taking government salute for that one. Now within four months of time people are suffering a lot day and night. Even my son went to Dharga Town area for petroling

**<u>ගරු මන්ත්‍රී - අහමඩ් දිල්සාත් මහතා විසින් ඉංග්‍රීසි භාෂාවෙන් සිදුකරන ලද කතාවේ සිංහල පරිවර්තනය.</u>**

මට කතා කරන්න දෙන්න.අවුරුදු 04 ක් තිස්සේ අපි කළේ පොඩි වැඩ කොටසක් පමණයි.ඒ කියන්නේ.පොඩි පොඩි පාරවල් හා පොඩි වැඩ විතරයි කළේ .නමුත් ඒවා ගැන කතා කළේ නෑ. ඒ නිසා තමයි.ඒක මගේ කොට්ඨාසයට විතරක් නෙවෙයි හැම කොට්ඨාසයටම අදාලයි.ගොරකදූව ජනතාවගේ වගකීම තියෙන්නේ මටයි.අපි ෆේස් බුක් එකට ගියාම හැමදාම දකින්න ලැබෙන්නේ නරක ආරංචි විතරයි.වතර්මාන රජයට පසුගිය මාස 04 ක් 05 ක් තිස්සේ ගෑස් ප්‍රශ්නයට විසඳුමක් ගොයා ගන්න බැරි උනා. ඒගොල්ලන්ට පෙට්‍රල් ප්‍රශ්නයට විසඳුමක් හොයා ගන්නත් බැරි උනා .රුපියල් 380 ට තිබුණු කිරි පිටි පැකට් එකක් දැන් රු 1025 .00යි .මේවා රජයට පාලනය කරගන්න බැරි උනා.අයි ඕ සී සමාගම මොන තීරණ ගත්තත් ඒකට රජය හිස නමනවා.දැන් මාස 04 ත් තිස්සේ මිනිස්සු රෑ දවල් බොහොම අමාරුවෙන් ජීවත් වෙන්නේ.මගේ පුතාත් තෙල් ගහගෙන ආවෙත් දගර්ා නගරයට ගිහින්.

**<u>ගරු මන්ත්‍රී - අල්හාජ් පී.එම්.එම්.උස්මාන් මහතා</u>**

Dear Chairman, How do you came to power? From the post box. What are you talking about the government now? You all came under the post box. Independent. You all went Kade for government. That's the reason now you are talking.

**<u>ගරු මන්ත්‍රී - අල්හාජ් පී.එම්.එම්.උස්මාන් මහතා විසින් ඉංග්‍රීසි භාෂාවෙන් සිදුකරන ලද කතාවේ සිංහල පරිවර්තනය.</u>**

ගරු සභාපතිතුමා,ඕගොල්ලෝ කොහොමද බලයට ආවේ.තැපැල් පෙට්ටියෙන්.එහෙනම් මොකටද රජය ගැන කතා කරන්නේ.ඕගොල්ලෝ තැපැල් පෙට්ටියෙන් ස්වාධිනව පත්වූ ආණ්ඩුවක්.ඒත් ඕගොල්ලෝ ආණ්ඩුවට කඩේ යනවා.ඒනිසා තමයි ඕගොල්ලෝ ඒ ගැන කතා කරන්නෙ.

<u>**ගරු මන්ත්‍රී - අහමඩ් දිල්සාත් මහතා**</u>

Let me talk. It's my time to talk. The petrol was filled in the 3.30 early in the morning. This is the pathetic situation for ordinary people in Sri Lanka. But government couldn't give the solutions. Even the power problem at the entire country is facing the problem. The Four Billion request from the IMF if it is not available means the entire country will be bankrupt. So, being the member of this Urban Council what I have done to my division is very limited. So, the glimpse of the hope from the government side is Zero. Now how can I go and talk to the people about the garbage and canal and other issues at my division? I have no answers and I have no hope.

<u>**ගරු මන්ත්‍රී - අහමඩ් දිල්සාත් මහතා විසින් ඉංග්‍රීසි භාෂාවෙන් සිදුකරන ලද කතාවේ සිංහල පරිවර්තනය.**</u>

මට කතා කරන්න දෙන්න.මේක මගේ වෙලාව .උදේ පාන්දර 3.30 ඉදලා තමයි පෙට්‍රල් පුරවගෙන ආවේ.මේ අසීරු තත්ත්වයට තමයි ලංකාවේ ඉන්න සාමාන්‍ය ජනතාව මූණ දීලා තියෙන්නේ.නමුත් රජයේන් කිසිම විසඳුමක් දෙන්න බැරි උනා .විදුලි ප්‍රශ්නයේදීත් මුළු රටම ඒකට මූණ දෙන්න වෙලා තියෙනවා.බිලියන 4 ඉල්ලීමට අනුව අයි එම් එෆ් එකෙන් මුදල් ලැබුනේ නැත්නම් මුළු ලංකාවම බංකොලොත් වෙයි.නගර සභා මන්ත්‍රි කෙනෙක් හැටියට අද මගේ කොට්ඨාසයට සීමිත් වැඩ කොටසක් තමයි කරන්න පුළුවන් උනේ.දැන් රටේ ජනතාවට ආණ්ඩුව ගැන තියෙන විශ්වාසය බින්දුවට බැහැලා තියෙන්නේ.දැන් මම කොහොමද මගේ කොට්ටාසයේ ජනතාවට ගිහිල්ලා කුණු ප්‍රශ්නය ගැනයි,ඇළ මාගර්යේ ප්‍රශ්නය හා අනෙක් ප්‍රශ්නය ගැනයි කතා කරන්නේ.මම ළඟ ඒවට උත්තර නෑ.ඒ වගේම දැන් විශ්වාසත් නෑ.

<u>**ගරු මන්ත්‍රී - අල්හාජ් පී.එම්.එම්.උස්මාන් මහතා**</u>

They don't have time to talk to you. Because they are in the queues of gas polims, and all polims. That's why they don't have time to talk to you. You came on last moment almost the ship go under the sea 65%. There are 25%. Get the solution from the government.

<u>**ගරු මන්ත්‍රී - අල්හාජ් පී.එම්.එම්.උස්මාන් මහතා විසින් ඉංග්‍රීසි භාෂාවෙන් සිදුකරන ලද කතාවේ සිංහල පරිවර්තනය.**</u>

මිනිස්සුන්ටදැන් ඔබතුමා එක්ක කතා කරන්න වෙලාවක් නෑ.ඒ මොකද කිව්වොත් මිනිස්සු දැන් ඉන්නේ ගෑස් සහ අනෙකතු පෝලිම් වල.ඔබතුමා නැව ගිලෙන්න පටන් ගත්තට පස්සේ තමයි කතා කරන්නේ.75% නැව ගිලිලා ඉවරයි.25% ඉතිරි වෙලා තියෙන්නෙ.ඒ නිසා ආණ්ඩුවෙන් විසඳුමක් ලබා ගන්න.

<u>**ගරු මන්ත්‍රී - අහමඩ් දිල්සාත් මහතා**</u>

I agree with you. I never say no to you. But the things are products we have to accept. Now what is solution from the, you know even the highest Buddhist Mahanayakas they said they to take take the convention. So, they requested to the president, prime minister, opposition leader and the members of the all the house to give proposals what are they going to do next? So, the people are suffering a lot. I personally pray my almighty Allah to give a better solution for this one. I'll just wait and see one or two months if it is not possible foe me I will resign from my this post. Thank you very much.

**ගරු මන්ත්‍රී - අහමඩ් දිල්සාත් මහතා විසින් ඉංග්‍රීසි භාෂාවෙන් සිදුකරන ලද කතාවේ සිංහල පරිවර්තනය.**

මම ඔබතුමාගේ කතාවට එකඟයි.මම කවදාවත් ඒකට නෑ කියන්නේ නෑ.හැබැයි අපි මේ දේවල් පිලි ගන්න ඕන්.දැන් මේවට විසඳුම මොනවද?ඔබතුමාලා දන්නවා දැන් බෞද්ධාගමේ මහනායකවරුත් කියලා තියෙනවා ඒගෙලේලන්ට මේකට පොදු එකඟතාවයකට එන්න කියලා .ඒනිසා ඒගොල්ලෝ ජනාධිපතිතුමාගෙන් අගමැතිතුමාගෙන් විපක්ෂ නායකගෙන් හා අනෙක් මන්ත්‍රිවරුන්ගෙන් යෝජනා ඉල්ලලා තියෙනවා ඒගොල්ලෝ ඉදිරියට මොනවද කරන්නේ කියලා.මිනිස්සු ගොඩක් දුන් විදිනවා .මම පුද්ගලිකව අල්ලා දෙවියන්ගෙන් ඉල්ලනවා මේකට විසඳුමක් ලබා දෙන්න කියලා.මම තම මාසයක් දෙකක් බලනවා.ආන්ඩුවෙන් මේකට විසඳුමක් ගත්තේ නැත්නම් මට කරන්න බැහැ.මම මගේ තනතුරෙන් ඉල්ලා අස්වෙනවා.බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී - අල්හාජ් පී.එම්.එම්.උස්මාන් මහතා**

I am telling you, Mr. House of the Chairman you resign right now. That's more better. Because of, what are you talking? Three months of time you going to get the solution? You and entire country in the queue. If you believe in the god, god never break the roof and giving you. We have to try. You remember that. All are believe god. You have to resign today.

**ගරු මන්ත්‍රී - අල්හාජ් පී.එම්.එම්.උස්මාන් මහතා විසින් ඉංග්‍රීසි භාෂාවෙන් සිදුකරන ලද කතාවේ සිංහල පරිවර්තනය.**

ගරු සභාපතිතුමා,මම එතුමාට කියන්න කැමතියි.දැන්ම ඉල්ලා අස්වෙන්න කියලා. ඒක තමයි හොඳම තීරණය .ඒකට හේතුව දැන් ඔබතුමා මොනවද කතා කරන්නෙ. මාස 03 ඇතුලත මේකට විසඳුමක් ලැබේවිද? ඔබතුමාත් මුළු රටේ ජනතාවත් දැන් ඉන්නේ පෝලිම් වල .ඔබතුමා දෙවියන් විශ්වාස කරනවා නම් දෙවියන් කිසිම දෙයක් දෙන්නේ නෑ.අපි තමයි උත්සහ කරන්න ඕන .ඒක මතක තියා ගන්න.අපි හැමෝම දෙවියන් විශ්වාස කරන අය .ඔබතුමා අදම ඉල්ලා අස් වෙන්න ඕන.

**ගරු මන්ත්‍රී - එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා**

රේගුව පාරේ ලොකු වලවල් වගයක් තියෙනවා කියලා දැනුම්දීමක් කරලා තියෙනවා.ඒ වැඩේ කෙරුනේ නෑ . අද අපේ පුතාම ඒ වලේ වැටිලා.

**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**

හාබර් හක ලඟද.හාබර් එක පාර ඇවිල්ලා මේ නගර සභාවට අයිති පාරක් නෙමෙයි ගරු මන්ත්‍රීතුමා. ආර්.ඩී.එකේ පාරක්. අපි ආර්.ඩී.එකට දැනුවත් කරලා තියෙනවා ඒ ගැන ඒක කරලා දෙන්න කියලා.

**ගරු මන්ත්‍රී - අල්හාජ් එම්.ඒ.එම්.අරූස් මහතා**

දැන් තියෙන තත්ත්වය අනුව අපි අවුරුදු 04 ක් ඉවරයිනේ දැන්. ඒ කියන්නේ අපේ නගර සභාවේ අර ජීම් එක ගැන කතා කෙරුවානේ. මරදාන වෙරටියෙන් හරි අරන් කරමු කියලා. ඒ වෙරටිය හරහා ඒක හදා ගන්න ඒ යෝජනාව සම්මත කරලා ඒක කරන්න දැන්.

**ගරු මන්ත්‍රී - අල්හාජ් පී.එම්.එම්.උස්මාන් මහතා**

මන්ත්‍රීතුමා රටේ තියෙන ප්‍රශ්නය උග්‍ර වෙලා. මිනිස්සුන්ට කන්න නැහැ. රටේ ජීම් එකක් ගැන කතා කරනවා.

**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**

හරි අපි ඒක ගැන සාකච්ඡා කරමු.

**ගරු මන්ත්‍රී - අල්හාජ් එම්.ඒ.එම්.අරූස් මහතා**

මේක සාකච්ඡා කරලා ඉවරයක් කරලා දෙන්නකෝ.

**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**

ගරු මන්ත්‍රීවරුනි, තව ටික කාලයයිනේ අපි ඔක්කොගෙම ආයු කාලය නගර සභාවේ. මේ සභාවේදි දැන් ළඟදිම ඡන්දයක් පවත්වන්න පුලුවන් තත්ත්වයක් නැහැ රටේ. ඒක හින්දා අපි පුලුවන් දේවල් ජනතාව වෙනුවෙන් අපි කරන්න ඕනේ. අපි බේරුවල ඉතාමත් කීතර්ීමත් නගර සභාවක්. පසුගිය කාලවකවානුවේදි අපි තමයි පාරවල් දැන්ටම දහයකට දොළහකට වැඩිය කාපට් කරලා තියෙන්නේ සමස්ථ ලංකාවෙන්ම. නගර සභාවක් අනුව අපි ඉතාමත් ඉදිරියෙන් තමයි ඉන්නේ. අපි තව කරන්න බලාපොරොත්තු වුනා. මිලියන 750 ක ණය ආධාරයක් අපිට ලැබෙන්න තිබුනා. ඒකෙන් අනිත් වැඩ ටික ඇළ මාගර්, තව අනිත් කාපට් මාගර්, සංවධර්න කටයුතු, සහ ආදායම් උපද්දවා ගන්න මාගර් පිළිපඳව තමයි අපි වැඩ කටයුතු කරන්න සූදානම් කරගෙන තිබුනේ. නමුත් ඒ සල්ලි ලැබුනේ නැහැ. කොරෝනා හින්දා ඉන්දියාවේ නැෂනල් ඩිවලොප්මන්ට් බැංකුවෙන් ලැබෙන්න තිබුන සල්ලි අපිට නැති වුනා. ඒක හින්දා අපිට ඒ ඩිවලොප්මන්ට් එක කරන්න බැරි වුනා. නමුත් අපි ආත්මතෘප්තියක් ලබනවා අපි හැම කොට්ඨාශයකටම කරන්න පුලුවන් දේවල් සුළු සුළු දේවල් අපි හැම දෙයක්ම මීට පෙර සභාවෙන් කරපු වැඩ වලට වඩා වැඩියි මේ කාලවකවානුවේදි අපි කරලා තියෙනවා. ඒක හින්දා අනාගතයේදි අපේ කාලපරිච්ඡේදයන් හොඳ වෙනකොට, රටේ ආථර්ික තත්ත්වයන් වැඩිවෙනකොට අපේ ආදායම් මාගර් වැඩි වෙනකොට තමුන්නාන්සේලාගේ සිතුම් පැතුම් අනුව, තමුන්නාන්සේලාගේ කොට්ඨාශවලට මීට වඩා වැඩ කරන්න තමුන්නාන්සේලාටත්, අපිටත් ශක්තිය, ධෛයර්ය ලාබා දෙමින් සභාවේ වැඩ කටයුතු මෙයින් අවසන් කරනවා බොහොම ස්තූතියි.

**ප:ව:3.40** ට සභාවේ කටයුතු අවසන් විණ.

***මෙම සභා වාතර්ාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා අතර යම් අනනුකූලතාවයක් ඇති වූවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුත්තේ ය.***

**අශෝක රණසිංහ,**
**ලේකම්,**
**බේරුවල නගර සභාව.**

**අල්හාජ් ඇම්.මසාහිම් මොහොමඩ්,**
**සභාපති,**
**බේරුවල නගර සභාව.**